මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.08.20 |

## විදේශ විනිමය ගෙවීම් සඳහා විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් භාවිතය

ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ අනෙකුත් වටිනාකම තැන්පත් කළ කාඩ්පත් හිමියන් එම කාඩ්පත් භාවිතා කරමින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින්ට කරන ඇතැම් විදේශ විනිමය ගෙවීම් සීමා කිරීමක්/තහනම් කිරීමක් සිදු කර ඇති බවට පණිවුඩ පැතිරයාම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු වී ඇත.

විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත්, එනම් ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ අනෙකුත් වටිනාකම තැන්පත් කළ කාඩ්පත් භාවිතය පිළිබඳව කිසිදු නව සීමාවක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා නොමැති බවත් එම කාඩ්පත් හිමියන්ට තම කාඩ්පත් භාවිතා කරමින් පුද්ගලික ස්වභාවයේ ජංගම ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින්ට ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දී ඇති බවත් මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමු. කෙසේවෙතත්, ඇතැම් බැංකු විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් භාවිතා කර ගනුදෙනු සිදු කිරීමේදී එම කාඩ්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ එම බැංකුවල පවත්නා විදේශ විනිමය තත්ත්වය අනුව ගනුදෙනුවලට ප්‍රමුඛතාවය ලබාදීම සඳහා යම් යම් සීමාවන් හඳුන්වාදී ඇති බව නිරීක්ෂණය කරන ලදී.

ඒ අනුව, විද්‍යුත් මුදල් මාරු කාඩ්පත් භාවිතා කරමින් නීත්‍යානුකූලව ගෙවීම් සිදු කිරීමේදී යම් දුෂ්කරතාවයකට මුහුණපෑමට සිදු වේ නම් ඊට අදාළ බැංකුව සම්බන්ධ කර ගන්නා ලෙසත් විදේශ විනිමය සකසුරුවම් ලෙස භාවිතා කරන ලෙසත් ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටී.

ඉහත කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු පහත ක්‍රම මගින් ලබාගත හැක.

(අ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිළ වෙබ් අඩවියේ (www.dfe.lk) “බාගත කිරීම්” යටතේ දක්වා ඇති විදේශ විනිමය පනත යටතේ බලයලත් වෙළෙඳුන්ට නිකුත් කර ඇති පහත දැක්වෙන විධානයන් වෙත පිවිසීමෙන්

i. ජංගම ගනුදෙනු සඳහා වන 2021.03.18 දිනැති 2021 අංක 02 දරන විධානයන්
ii. විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සඳහා වන 2021.03.18 දිනැති 2021 අංක 03 දරන විධානයන්

(ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව,
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01
දුරකථන +94112398641, +94112477023
විද්‍යුත් තැපැල : dfe@cbsl.lk